සැ. යු. - මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2003 වර්ෂයේ ඔක්තෝබර් - දෙසැම්බර් කාර්තුවට අදාළ මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,543 - 2008 මාර්තු මස 28 වැනි සිකුරාදා - 2008.03.28

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 330 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 330 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 335 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 339 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු.- (i) ශ්‍රී සුමංගල සරණසේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2008 පෙබරවාරි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත් කෙටුම්පත 2008 පෙබරවාරි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත 2008 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීන් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 අප්‍රේල් මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 මාර්තු මස 19 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මොණරාගල**

01. මොණරාගල/දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක : බී ආර් 05/06 යටතේ රාජ සන්තක කිරීමට යටත් වූ, අංක 24 ශ්‍රී 4979 දරන ඉසුසු වර්ගයේ ලොරි රථය විකිණීම සඳහා ටෙන්ඩර්පත් කැඳවනු ලබන අතර, 2008 අප්‍රේල් මස 18 වැනි සිකුරාදා පෙ.ව. 9.00 තෙක් ටෙන්ඩර්පත් බාර ගනු ලැබේ.

02. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී, එකී ස්ථානයට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවනට අවසර දෙනු ලබන අතර, ටෙන්ඩර්පත් ඉහත සඳහන් දිනයත් හි දී, මොණරාගල දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ දී විවෘත කරනු ලැබේ.

03. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ 2008 අප්‍රේල් මස 17 වැනි දින ප.ව. 3.00 දක්වා අධිකරණ කාර්යාලය වෙතින් ලබා ගත හැකි ඉල්ලුම්පත්‍රයකින් පමණය.

04. සියලුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුක්තව, එක් කවරයක බහා යොමු කළ යුතු අතර, ටෙන්ඩර්පත් බහා එවන ලිපි කවරයේ උඩ වම්පස කෙළවරේ 'අංක 24 ශ්‍රී 4979 දරන ඉසුසු ලොරි රථය සඳහා ටෙන්ඩර් පත්‍රය' යනුවෙන් සඳහන් කළ යුතු අතර, තම නම සහ ලිපිනයද, ලිපි කවරයේ වම් පස පහළ කොටසේ සඳහන් ව තිබිය යුතුය.

05. ටෙන්ඩර්පත් දිසා විනිසුරුතුමා, දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ද, එවිය හැකි අතර කිසියම් ටෙන්ඩර්කරුවෙකු කැමැත්තේ නම් ස්වකීය ටෙන්ඩර් පත්‍රය මුද්‍රා තබා පෞද්ගලිකවම හෝ නියෝජිතයෙකු මඟින් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත බාර දී ඇති බවට, කුවිතාන්සියක් ලබා ගත හැකිය. (එබඳු අවස්ථාවක දී ද, ලිපි කවරයෙහි ඉහත (4) වන ඡේදයේ කරුණු සම්පූර්ණ කොට ඉදිරිපත් කළ යුතුය.)

06. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමේ දී, එක් කට්ටලයක් සඳහා රු. 100 ක පෝරම හා ගාස්තුවක් අය කෙරෙන අතර, ආපසු ගෙවනු ලබන රු. 2000 ඇප තැන්පතුවක් ද, තැන්පත් කළ යුතුය. මෙම ගෙවීම සඳහා කුවිතාන්සියක් නිකුත් කරනු ඇත.

07.වැඩිම මිල ඉදිරිපත් කළ ඉල්ලුම්කරුට, බදුල්ල මහාධිකරණය ටෙන්ඩර් මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු, හා එම ටෙන්ඩර් මණ්ඩලය විසින්ම නියම කළ දිනට පෙර සම්පූර්ණ මුදල් ගෙවීමෙන් අදාළ රථය ඉවත් කරගත හැකිය.

08. ටෙන්ඩරය පිළිබඳ සම්පූර්ණ කොන්දේසි හා විස්තර අධිකරණ කාර්යාලය වෙතින් ලබාගත හැකිය.

එම්. ඩබ්. ජේ. කේ. වීරමන්,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
මොණරාගල.

2008 මාර්තු මස 05 වැනි දින,
මොණරාගල දිසා අධිකරණයේ දී ය.

03-870

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - නාවලපිටිය**

**රාජසන්තක කරනලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

නාවලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලදුව වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2008 මැයි මස 10 වැනි සෙනසුරාදා දින පැය 10.00ට අධිකරණ භූමියේදී වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන තැනැත්තෙකු සිටී නම් වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ.ව. 10.00ට පෙර ස්වකීය හිමිකම් තහවුරු කළ යුතුය.

03. එදින පැය 9.30 සිට පැය 10.00 දක්වා මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසියට නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලන්සුව පිළිනොගන්නා අවස්ථාවලදී එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අභිමතය අධිකරණය සතුවේ.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේදීම මුදලින් ගෙවීම් කළ යුතු අතර චෙක්පත් හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. මිලදී ගන්නා භාණ්ඩ එදින පැය 15.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

07. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගැනීමට ඉදිරිපත්වන තැනැත්තන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය.

ඒ. එම්. ඒ. වසන්ත කුමාර,
මහෙස්ත්‍රාත්.

2008 මාර්තු මස 11 වැනි දින,
නාවලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### ඉහත කී උපලේඛනය

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01 | 58052 | සවල් දෙකයි, යකඩ බාල්දි දෙකයි |
| 02 | 56712 | සවල් එකයි |
| 03 | 56704 | සවල් එකයි |
| 04 | 56710 | සවල් එකයි |
| 05 | 58199 | සවල් එකයි |
| 06 | බී.138/03 | ලන්තෑරුම් එකයි, කෑන් දෙකයි |
| 07 | බී.269/03 | කැති එකයි |
| 08 | බී.116/04 | කප්පාදු පිහි එකයි |
| 09 | 56744 | සවල් එකයි |
| 10 | 46754 | කෝපි පිහි එකයි |
| 11 | අංක රහිත | මේස පිහි හතයි |
| 12 | අංක රහිත | කෝපි පිහි හතරයි |
| 13 | අංක රහිත | වක් පිහි තුනයි |
| 14 | අංක රහිත | දෑකැති දෙකයි |
| 15 | අංක රහිත | මට්ටම් පිහි එකයි |
| 16 | අංක රහිත | අත් කියත් එකයි |
| 17 | අංක රහිත | කැති එකයි |
| 18 | අංක රහිත | කම්බි කැබැල්ලක් |
| 19 | අංක රහිත | ජැක් ලීවර් එකයි |
| 20 | අංක රහිත | යකඩ බෝල්ට් ඇණ එකයි |
| 21 | අංක රහිත | දුනුකොල කැබැල්ල සහ පින් එක |
| 22 | අංක රහිත | අබලන් වාපිසින දෙකයි |
| 23 | අංක රහිත | අබලන් ත්‍රීවීල් ඇක්සල් එකයි |
| 24 | අංක රහිත | යකඩ කම්බි තුනයි |
| 25 | අංක රහිත | යකඩ ඉනි තුනයි |
| 26 | අංක රහිත | අබලන් බයිසිකල් පෝක් එකයි, පැටල් එකයි |
| 27 | අංක රහිත | පෙට්ල් ලාම්පු එකයි |
| 28 | අංක රහිත | ඇලුමිනියම් කුඩා සාස්පාන එකයි |
| 29 | අංක රහිත | ප්ලාස්ටික් බාල්දි දෙකයි |
| 30 | අංක රහිත | හැදි එකක් හා දීසිය |
| 31 | අංක රහිත | උදලු තල තුනයි |
| 32 | අංක රහිත | පොරොව හා ටෙස්ටරය |
| 33 | අංක රහිත | උදලු එකයි |
| 34 | අංක රහිත | මිටි දෙකක් හා ගල්කටුව |
| 35 | අංක රහිත | පිහිතල එකයි, යකඩ කපන කියත් තල එකයි |
| 36 | අංක රහිත | බාල්දි තුනයි |
| 37 | අංක රහිත | ලන්තෑරුම් එකයි |
| 38 | අංක රහිත | බේසම් එකයි |
| 39 | අංක රහිත | ඇලුමිනියම් කල එකයි |
| 40 | අංක රහිත | පී. වී. සී. බට විසිඅටයි |
| 41 | අංක රහිත | අබලන් වී ඇති ටී. වී. ස්ටෑන්ඩ් එකයි |
| 42 | අංක රහිත | ටකරන් තහඩු විස්සයි |
| 43 | අංක රහිත | විවිධ ප්‍රමාණයෙන් හිස් තහඩු බැරල් තොගයක් |
| 44 | අංක රහිත | විවිධ ප්‍රමාණයේ හිස් බෝතල් තොගයක් |
| 45 | අංක රහිත | අංකය අපැහැදිලි අබලන් පාපැදි හතරක් |
| 46 | අංක රහිත | ලොකු කියත් දෙකයි |
| 47 | අංක රහිත | බන්ඩි කියත් තුනයි |
| 48 | අංක රහිත | සල්අඩ එකයි |
| 49 | අංක රහිත | ගල්කටු එකයි |

03-812

### මහෙස්ත්‍රාත් අධිකරණය - මොරවක

#### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මොරවක මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හිමිකම් නොපාන ලද හා විකුණා මුදල් රජයට බැර කිරීමට නියමිතව ඇති පහත සඳහන් භාණ්ඩ 2008.05.03 දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි සඳහන් වන හිමිකම් භාණ්ඩයක හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

02. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට පෙර වෙන්දේසියේ විකිණීමට ඇති භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගත හැකි අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එම අවස්ථාවේදී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

05. වෙන්දේසියේ භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් ජාතික හැඳුනුම්පත රැගෙන පැමිණිය යුතුය.

එල්. සී. මදනායක,
අතිරේක දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
මොරවක.

2008 මාර්තු මස 05 වැනි දින,
මොරවක මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

#### භාණ්ඩ පිළිබඳ විස්තරය

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| 01. | 96173 | රවුම් කියත් තලය සවිකරන ලද ඉරුම් බංකු 01යි |
| 02. | 96108 | රවුම් කියත් තලය සවිකරන ලද ඉරුම් බංකු 01යි |
| 03. | 96405 | රවුම් කියත් තලය සවිකරන ලද ඉරුම් බංකු 01යි |
| 04. | 96693 | රවුම් කියත් තලය සවිකරන ලද ඉරුම් බංකු 01යි |
| 05. | 96758 | රවුම් කියත් තල 01යි |
| 06. | 96814 | රවුම් කියත් තලය සවිකරන ලද ඉරුම් බංකු 01යි |
| 07. | 96593 | රවුම් කියත් තලය සවිකරන ලද ඉරුම් බංකු 01යි |
| 08. | 98187 | රවුම් කියත් තලය සවිකරන ලද ඉරුම් බංකු 01යි |
| 09. | 95823 | රවුම් කියත් තලය සවිකරන ලද ඉරුම් බංකු 01යි |
| 10. | 99009 | රවුම් කියත් තලය සවිකරන ලද ඉරුම් බංකු 01යි |
| 11. | 00227 | රවුම් කියත් තලය සවිකරන ලද ඉරුම් බංකු 01යි |
| 12. | 81107 | ඉරුම් කියත් 01යි |
| 13. | 98190 | බන්ඩි කියත් 01යි |
| 14. | 98193 | තේ පිහිය 01යි |
| 15. | 98963 | තේ පිහිය 01යි |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| 16. | 98964 | මේස පිහිය 01යි |
| 17. | 98960 | මන්නා පිහිය 01යි, උදලු 01යි |
| 18. | 85774 | අත්පොරව 01යි |
| 19. | 96941 | පෝරව 01යි |
| 20. | 97020 | පොරව 01යි |
| 21. | 96317 | පොරව 01යි |
| 22. | 95276 | බාල්දි 01යි |
| 23. | 95280 | සවල් 01යි |
| 24. | 95478 | සවල් 01යි |
| 25. | 95253 | වේවැල් කුඩ 01යි |
| 26. | 95761 | සවල් 01යි |
| 27. | 95766 | සවල් 01යි |
| 28. | 95767 | වේවැල් කුඩ 01යි |
| 29. | 95769 | සවල් 01යි |
| 30. | 95780 | සවල් 01යි |
| 31. | 95762 | සවල් 01යි |
| 32. | 95988 | සවල් 01යි |
| 33. | 96079 | සවල් 02යි |
| 34. | 96147 | සවල් 01යි, වේවැල් කුඩ 01යි |
| 35. | 96168 | සවල් 01යි |
| 36. | 96169 | සවල් 01යි |
| 37. | 96183 | වේවැල් කුඩ 01යි |
| 38. | 96296 | බාල්දි 01යි, කුඩ 01යි |
| 39. | 96642 | සවල් 01යි |
| 40. | 96687 | වේවැල් කුඩ 02යි |
| 41. | 97087 | සවල් 02යි |
| 42. | 97667 | වේවැල් කුඩ 01යි |
| 43. | 97668 | වේවැල් කුඩ 01යි |
| 44. | 97669 | වේවැල් කුඩ 01යි |
| 45. | 97764 | සවල් 02යි |
| 46. | 97764 | බාල්දි 02යි |
| 47. | 97798 | වේවැල් කුඩ 01යි |
| 48. | 97842 | සවල් 01යි |
| 49. | 97892 | සවල් 01යි |
| 50. | 97948 | වේවැල් කුඩ 01යි |
| 51. | 98984 | සවල් 92යි |
| 52. | 99369 | සවල් 01යි |
| 53. | 67976 | දික් කියත් 01යි |
| 54. | 83629 | 01. දික් කියත් 01යි |
| | | 02. පීරි 01යි |
| 55. | 67468 | 01. දික් කියත් 01යි |
| | | 02. කඳන් පිහිය |
| | | 03. අතකොපුව |
| | | 04. ලඹ 01යි |
| 56. | 71747 | මහ කියත් 01යි |
| 57. | 76858 | පොඩි කියත් 01යි |
| 58. | 79037 | ඉරුම් කියත් 01යි |
| 59. | 66011 | බණ්ඩි කියත් 01යි |
| 60. | අංක රහිත | හිස් ලොකු බෝතල් තොගයක් |
| 61. | අංක රහිත | හිස් භාගේ බෝතල් තොගයක් |
| 62. | අංක රහිත | හිස් කලේ බෝතල් තොගයක් |
| 63. | අංක රහිත | හිස් බැරල් කීපයක් |
| 64. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 65. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 66. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 67. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 68. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 69. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 70. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 71. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 72. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 73. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 74. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 75. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 76. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 77. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 78. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 79. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 80. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 81. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 82. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 83. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 84. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 85. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 86. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 87. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 88. | අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 89. | 96597 | 01. යතුකැට 01යි |
| | | 02. කියත් 01යි |
| | | 03. අතකොලුව 01යි |
| 90. | අංක රහිත | හිස් ප්ලාස්ටික් කල 03යි |
| 91. | අංක රහිත | හිස් බාස්කට් තොගයක් |
| 92. | 98962 | පිහිය 01යි |
| 93. | 96320 | තේ පිහිය 01යි |
| 94. | 89314 | පොරව 01යි |
| 95. | 98984 | සවල් 02යි |
| 96. | 91077 | යකඩ කැබලි 04ක් |
| 97. | 80736 | බණ්ඩි කියත් 01යි |
| | | පන්දම් 01යි |
| 98. | 64795 | බන්ඩිකියත් 01යි |
| 99. | 63614 | මහකියත් 01යි |
| 100. | 66103 | දම්වැල් කියත් 01යි |
| 101. | 92996 | දම්වැල් කියත් 01යි |
| 102. | 91570 | දම්වැල් කියත් 01යි |
| 103. | 89827 | දම්වැල් කියත් 01යි |
| 104. | 90768 | අංක 30 ශ්‍රී 0525 දරන හයියස් වර්ගයේ වෑන් රථය (අබලන් තත්ත්වයේ ඇත) |
| 105. | 85958 | අංක 73-559 දරන ෆාම්මාස්ටර් අත් ට්‍රැක්ටරය (අබලන් තත්ත්වයේ ඇති) |
| 106. | 86346 | 114-6639 දරන වැලි වර්ගයේ යතුරුපැදිය (අබලන්) |
| 107. | ඒ.ආර්.592/07 | අංක එස්පීජීටී - 9248 දරන ලොන්සින් ඊඩී 90 යතුරුපැදිය |
| 108. | 85429 | අංක එස්පීඑච් - 1006 දරන පිනර් වර්ගයේ යතුරුපැදිය |
| 109. | 27147 | අංක 125-9726 දරන දෙකට කැඩී ඇති වැලි වර්ගයේ යතුරු පැදිය |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| 110. | 78639 | එස්පී 93 -7426 දරන හොන්ඩා 90 යතුරුපැදිය |
| 111. | 73631 | පිහිය 01යි |
| 112. | 77314 | අලවංගු 01යි<br>පොරව එකයි |
| 113. | 77001 | කැති 01යි |
| 114. | 77433 | පිහිය 01යි |
| 115. | 77531 | පිහිය 01යි |
| 116. | 77653 | වක් පිහිය 01යි |
| 117. | 79043 | යකඩ කූරු 01යි |
| 118. | 78242 | පොරව තල 01යි |
| 119. | 78092 | උදලු 01යි |
| 120. | 78138 | පිහිය 01යි |
| 121. | 78933 | මන්නා පිහිය 01යි |
| 122. | 78910 | වේවැල් කුඩ 01යි |
| 123. | 96184 | ලී මිට සහිත යකඩ පෝරු 01යි |
| 124. | 90229 | දම්වැල් කියත් 01යි |
| 125. | 99389 | මේස පිහිය 01යි |
| 126. | 80336 | වක් පිහිය 01යි |
| 127. | 81550 | කුරුදු කැති 01යි |
| 128. | 89050 | වක් පිහිය 01යි |
| 129. | 80510 | වක් පිහිය 01යි |
| 130. | 80174 | උදලු 01යි |
| 131. | 84099 | පොරව 01යි |
| 132. | 83609 | උදලු 01යි |
| 133. | අංක රහිත | හිස් බැරල් කිපයක් |
| 134. | අංක රහිත | මහෙස්ත්‍රාත් නිල නිවසේ වහලයෙන් ඉවත් කරන ලද උළු තොගයක් |
| 135. | අංක රහිත | මහෙස්ත්‍රාත් නිල නිවසෙන් ඉවත් කරන ලද කොමඩ් 02යි |

03-734

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - මඩකලපුව

### අධිකරණ නඩු භාන්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරණ නඩු වලින් අයිතිකරුවන් නොමැති රාජසන්තක කරන ලද පහත විස්තර සඳහන් භාණ්ඩ 2008.04.26 වැනි දින පෙ. ව. 9.00 සිට ප. ව. 4.00 දක්වා මෙම අධිකරණයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙම නඩු භාණ්ඩ සම්බන්ධයෙන් අයිතිය කියා සිටින යම් තැනැත්තෙකු වේ නම් ප්‍රසිද්ධ වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම තම අයිතිය පිළිබඳ වූ ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය.

03. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම මහජනතාවට නඩු භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

04. අපේක්ෂිත මිල ඉල්ලීමක් ඉදිරිපත් නොවන ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත් කිරීමට අධිකරණයට බලය ඇත.

05. භාණ්ඩ මිළ දී ගත් වහාම අදාල මුදල ගෙවා අධිකරණ සංකීර්ණයෙන් භාණ්ඩ ඉවත් කර ගත යුතුය. ගෙවීම සඳහා චෙක්පත් භාරගනු නොලැබේ.

06. නඩු භාණ්ඩ මිල දී ගන්නා තම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

එම්. වයි. එම්. ඉර්ෂදීන් මහතා,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
මඩකලපුව.

| අනුක්‍රමික අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ පිළිබඳ විස්තර | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | ඒ. ආර්. 190/07 | ප්ලාස්ටික් ඔරු | 01 |
| 02. | ඒ. ආර්. 92/07 | පාපැදි<br>අංක 559555507 | 01 |
| 03. | ඒ. ආර්. 219/07 | 1. සෙන්ට්‍රික් පොම්ප | 01 |
| | | 2. අංක 60628 දරන ස්ටාට් මෝටර් | 01 |
| | | 3. සෙරමික් බේසම් | 01 |
| 04. | ඒ. ආර්. 222/07 | පාපැදි අංක 8279874 | 01 |
| 05. | ඒ. ආර්. 222/2007 | 1. පාපැදි අංක 56 සි 578සී 9 | 01 |
| | | 2. පාපැදි අංක ටී. ඕ. 28840 | 01 |
| 06. | ඒ. ආර්. 442/2007 | පාපැදි අංක 69262614 | 01 |
| 07. | ඒ. ආර්. 457/2007 | පාපැදි | 01 |
| 08. | ඒ. ආර්. 520/2007 | පාපැදි අංක 57196086 | 01 |
| 09. | ඒ. ආර්. 674/2007 | පාපැදි අංක 520724 | 01 |
| 10. | ඒ. ආර්.675/2007 | පාපැදි අංක 55987189 | 01 |
| 11. | ඒ. ආර්. 789/2007 | පිහිය | 01 |
| 12. | බී 109/05 | පිහිය | 01 |
| 13. | බී. 168/05 | 1. ලසර් එල්. ජී. 834 වර්ගයේ ගිටාර් | 01 |
| | | 2. පැනසොනික් සුපර් රයිවර් ඩෙක් (එල්. එස්. එච්. ඒ. 22933 එන්බී එන්බීජියුඑස් අංක දරන ඩෙක් යන්ත්‍ර) | 01 |
| 14. | බී. 203/2006 | පාපැදි අංක 68225119 | 01 |
| 15. | බි. 208/2006 | පාපැදි (කැඩී ඇත) | 01 |
| 16. | බී. 346/2005 | පාපැදි අංක රහිත | 01 |
| 17. | 3569/පී. සී./05 | පිහිය | 01 |
| 18. | 5894/පීසී/2006 | උදැල්ල | 02 |
| 19. | 60998/පීසී/2004 | පිහිය | 01 |
| 20. | 61218/පීසී/2005 | පිහිය | 01 |
| 21. | 62597/පීසී/2005 | පිහිය | 01 |
| 22. | 63186/එම්ටී/2005 | පාපැදි (කැඩී ඇත) | 01 |
| 23. | 63491/පීසී/2005 | උදැල්ල | 01 |
| 24. | 66742/එම්ටී/2005 | පාපැදි (කැඩී ඇත) | 01 |
| 25. | 69138/පීසී/2006 | 1. සුදුපාට පරණ කාර් රේඩියෝ | 01 |
| | | 2. කලුපාට ස්පීකර් | 01 |
| | | 3. ආච් වර්ගයේ කැසට් රේඩියෝ | 01 |
| 26. | 69419/එම්ටී/2005 | පාපැදි අංක ඒප් 41228 | 01 |
| 27. | 66958/පීසී/2005 | පාපැදි අංක 55721842 | 01 |
| 28. | 71498/සීර්බී/2006 | 1. පිහිය | 02 |
| | | 2. තරාදි | 01 |
| | | 3. පඩි සමග තරාදි | 01 |

| අනුක්‍රමික අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ පිළිබඳ විස්තර | ප්‍රමාණය |
|---|---|---|---|
| | | 4. යකඩ බාල්දි | 01 |
| | | 5. තේ පෝච්චි | 01 |
| | | 6. ටකරන් | 04 |
| | | 7. යකඩ බට | 01 |
| 29. | 71942/එෆ්/2007 | යකඩ බාල්දි | 01 |
| 30. | 71941/එෆ්/2007 | උදැල්ල | 01 |
| 31. | 71944/එෆ්/2007 | උදැල්ල | 01 |
| 32. | 73217/ඔඩීඩී/2007 | පාපැදි අංක 55681406 | 01 |
| 33. | 75857/එෆ්/2008 | 1. හාන්සි පුටු | 02 |
| | | 2. ඇද | 04 |
| | | 3. පුටු සෙට් (කුෂන්) පුටු -03, සෙට් 01 | 04 |
| | | 4. පුටු සෙට් පුටු 03, සෙට් 01 | |
| | | පොඩි මේස 01 | 05 |
| | | සෝකේස් | 01 |
| 34. | නඩු අංකයක් නොමැත | 1. පිහිය | 05 |
| | | 2. උදැල්ල | 04 |
| | | 3. පිහිය | 01 |
| | | 4. පිහිය | 02 |
| | | 5. පිහිය | 05 |
| | | 6. යකඩ කම්බි | 05 |
| | | 7. යකඩ කම්බි | 05 |

03-732

---

## ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කෑගල්ල

### පාවිච්චියෙන් ඉවත් කළ ලී බඩු සහ කාර්යාල උපකරණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම කාර්යාලයට අයත්ව දැනට භාවිතයෙන් ඉවත් කර ඇති පහත උපලේඛණයේ සඳහන් ලී බඩු සහ කාර්යාල උපකරණ 2008 අප්‍රේල් මස 07 වන දින පෙ. ව. 9.30ට නිල්වක්ක පාරේ පිහිටා ඇති පැරණි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල පරිශ්‍රයේ දී ප්‍රසද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙම උපකරණ එදින පෙ. ව. 8.30 සිට පරීක්ෂාකර බැලිය හැකි අතර ගැණුම්කරුවන් විසින් මිලදී ගැනීමට පෙර එම භාණ්ඩවල තත්ත්වය පිළිබඳව සෑහීමකට පත්විය යුතුය. ලංසු මිල තීරණය වූ වහාම මුළු මුදල මුදලින් ගෙවිය යුතු අතර එදින ප. ව. 4.00 ට පෙර මෙම භාණ්ඩ ඉවත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

03. මිලදී ගන්නා භාණ්ඩ පිළිබඳව පසුව කරනු ලබන පැමිණිලි භාර නොගන්නා අතර මිලදී ගෙන නියමිත වේලාවට පෙර ඉවත්කර නොගන්නා භාණ්ඩ පිළිබඳව මා විසින් වගකියනු නොලැබේ. වෙන්දේසිය තබා ඇති භාණ්ඩ පූර්ව දැනුම් දීමකින් තොරව වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය මා සතුය.

ඩබ්ලිව්. එම්. ආර්. බී. විජේකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කෑගල්ල.

### උපලේඛනය

| | | |
|---|---|---|
| 01. | සාමාන්‍ය පුටු (ඇඳි රහිත ) ලී | 43 |
| 02. | විධායක මේස | 01 |
| 03. | යතුරු ලියන මේස | 01 |
| 04. | කුඩා මේස | 02 |
| 05. | ලිපිකරු ලී මේස | 33 |
| 06. | ඇඳි පුටු ලී | 16 |
| 07. | කුෂන් ඇඳි පුටු වානේ | 07 |
| 08. | අල්මාරි වානේ | 16 |
| 09. | වානේ කැබිනට් ලාච්චු 04 | 14 |
| 10. | සාමාන්‍ය පුටු වානේ (ඇඳි රහිත කුෂන් පුටු) | 47 |
| 11. | කැල්කියු ලේටර් | 08 |
| 12. | පන්චර් | 08 |
| 13. | ස්ටේප්ලර් | 13 |
| 14. | ස්ටෙන්සන් කෝඩ් | 01 |
| 15. | අඩි 50 මණින පටි | 03 |
| 16. | ප්ලයිවුඩ් ලෑලි | 04 |
| 17. | විදුලි පන්දම් | 02 |
| 18. | ඉබි යතුරු | 11 |
| 19. | ටැප් කරාම | 05 |
| 20. | ෆැක්ස් මැසිම | 01 |
| 21. | බොයිලේරුව | 01 |
| 22. | හම් බෑග් | 17 |
| 23. | රෝනියෝ මැෂින් | 01 |
| 24. | දැන්වීම් පුවරු | 02 |
| 25. | ස්ටූල් | 02 |
| 26. | ලී රාක්ක ලොකු (ලී ගලවා ඇත) | 01 |
| 27. | පිළිගැනීමේ කවුන්ටර් | 01 |
| 28. | ලාච්චු 04 ලී කැබිනට් | 02 |
| 29. | අල්මාරි ලී | 02 |
| 30. | ලී රාක්ක කුඩා | 02 |
| 31. | විදුලි පංකා සිවිලින් | 01 |

03 - 837

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

සමාගමේ පූර්ව නාමය : මැක්වුඩ්ස් රිසෝට්ස් (ප්‍රයිවට්)ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 61318
ලියාපදිංචි කළ කාර්යාලය : අංක 10, ඥානාර්ථ ප්‍රදීප මාවත, කොළඹ 08
සමාගමේ නව නාමය : තැප්රොස්පා රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

03-779

---

### ඇටර්නි බලය අවලංගු කිරීම පිළිබඳ දැනුම් දීමයි

රුවන්වැල්ල, අවිස්සාවේල්ල පාර, අංක 291 හි පදිංචි යද්දෙහි ආරච්චිල්ලාගේ විජේවර්ධන වන මම, පී. ඒ. ඒ. ධර්මකීර්ති නොතාරිස්වරයා සහතික කළ අංක 349 සහ 1993.07.21 දිනත් දරන ඇටර්නි බලකරය ප්‍රකාරව මාගේ භාර්යාව වන වීරසිංහ මුදියන්සේලාගේ සුමනාවතී ද සමග එක්ව අපගේ ඇටර්නි බලකරු වශයෙන් රුවන්වැල්ල යටන්වල පදිංචි වීරසිංහ මුදියන්සේලාගේ අමරසිංහ යන අය පත්කර ඇතත්, දැනට මෙම දිවයිනට පැමිණ සිටින මා හට එකී ඇටර්නි බලය ප්‍රකාරව මාගේ දේපල සහ කාරණා කටයුතු පිළිබඳව ඉහත කී ඇටර්නි බලකරුට ලබා දී ඇති බලය අවලංගු කිරීම අවශ්‍යව ඇත. එබැවින්, ඉහත කී අංක 349 දරන ඇටර්නි බලකරය පිට මින් ඉදිරියට මාගේ ඇටර්නි බලකරු වශයෙන් ඉහත කී ඇටර්නි බලකාර වීරසිංහ මුදියන්සේලාගේ අමරසිංහ යන අය ක්‍රියා කිරීමක් නොමැති බවත්, ඔහු විසින් මා නමින් සිදු කරනු ලබන යම් හෝ ක්‍රියාවක් වලංගු නොවන බවත්, ශ්‍රී ලංකා ජන රජය ඇතුලු සියලු දෙනා වෙත මෙයින් දැනුම් දී සිටිමි.

යද්දෙහි ආරච්චිල්ලාගේ විජේවර්ධන.

03-740

---

### ඇටර්නි බලය අවලංගු කිරීම

ජාඇල, වැලිගම්පිටිය, උසාවිය පාර, 2 වන පටුමග, අංක 11 එෆ්, හි පදිංචි වසුධා ලවංගි ඥාණසිරි වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයට සහ පොදු ජනතාවට මෙ මගින් දැනුම් දෙනු ලබන්නේ මා විසින් කැලණිය, පිළපිටිය අංක 425 දරන ස්ථානයේ පදිංචි කුමාරපේලි ආරච්චිගේ හේමානන්ද කුමාරසිංහ යන අයට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කුමාර ගමගේ ජිනසේන විසින් 2003 මැයි මස 03 වැනි දින සහතික කරන ලද අංක 05 දරන ඇටර්නි බලපත්‍රය අවලංගු බලරහිත සහ නිෂ්ප්‍රභා කර ඇති බවය.

වසුධා ලවංගි ඥාණසිරි.

03-801

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

රාගම කැටගේ වත්ත අංක 27/21 දරන පදිංචි පතිරගේ සුනන්දා පෙරේරා වන මම දැනට ප්‍රංශයේ පහත ලිපිනයෙහි පදිංචි වී සිටිමි.

II Bis Rue Ras pail 93400 France

මා විසින් කැටගේ වත්ත අංක 27/21 දරන තැන පදිංචි පතිරගේ කාන්ති පෙරේරා හට දී ඇති ප්‍රසිද්ධ නොතාරිස් ටිජ් නලවංශ මහතා විසින් ලියා සහතික කරන ලද අංක 1398 සහ 1999.06.09 දිනැති ඇටෝර්නි බලපත්‍රය 2008.02.01 දින සිට අවලංගු කරන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

03-800

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 පෙබරවාරි 11 දිනදී සන්බ්‍රීම් මාර්කටින් (ප්‍රයිවට්) ලිමිටඩ් සංස්ථාගත කරනු ලැබ ඇති බව 2007 අංක 07 සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ :

සමාගමේ නම: සන්බ්‍රීම් මාර්කටින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය: පී. වී. 63012
ලේඛනගත කාර්යාලය: අංක 192, පුත්තලම් පාර, නිකවැරටිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

හේරත් එච්. එම්. සීපී.
අධ්‍යක්ෂ.

03-787

---

### සීමාසහිත සමාගමක් නම වෙනස්කර ස්ථාපිත කිරීම

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ අංක 7 දරන පනතේ 9(2) වන ඡේදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි

සමාගමේ අළුත් නම :සිංගාලා ට්‍රේඩින් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ පූර්ව නම: ශ්‍රී ලින්ක් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගම් අංක: **N(PVS)** 40942
වෙනස්කළ දිනය : 2008.02.27
ලියාපදිංචි ලිපිනය: අංක: 291/40, හැව්ලොක් ගාර්ඩන්ස්, කොළඹ 6

03-789/1

## සීමාසහිත සමාගමක් ස්ථාපිත කිරීම

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 7 දරන ඡේදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි

සමාගමේ නමඃ රීජන්ට් ඉන්ෆෝටෙක් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
ලියාපදිංචි අංක සහ දිනයඃ **PV** 63160 දිනයඃ 2008.02.25
ලියාපදිංචි ලිපිනයඃ අංක 26, වජිර පාර, කොළඹ 4.

සමාගම් ලේකම්,
නෙක්සියා කෝර්පරේට් කන්සල්ටන්ස් (පුද්ගලික) සමාගම.

03-789/2

## සීමාසහිත සමාගමක් ස්ථාපිත කිරීම

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 7 දරන ඡේදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි

සමාගමේ නම :සිලෝන් ඉන්ඩස්ට්‍රියල් මිනරල්ස් ඉන්ටර්නෂනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
ලියාපදිංචි අංක සහ දිනය :**PV** 62963 දිනයඃ .2008.02.06
ලියාපදිංචි ලිපිනයඃ අංක 20, ටිකල් රෝඩ්, කොළඹ 8.

සමාගම් ලේකම්,
නෙක්සියා කෝර්පරේට් කන්සල්ටන්ස් (පුද්ගලික) සමාගම.

03-789/3

## ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත නම සඳහන් පුද්ගලික සමාගම 2008.01.23 දින ලියාපදිංචි කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | ට්‍රයන්ගල් හොටේල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි අංකය | : | පී.වී. 62555 |
| ලියාපදිංචි කාර්යාලය | : | අංක 260/20, මල්වත්ත පාර, යාපන හංදිය, අනුරාධපුරය. |

ප්‍රේමචන්ද්‍ර ඇපා,
සමාගමේ ලේකම්.

03-840

## ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත නම සඳහන් පුද්ගලික සමාගම 2008.01.23 දින ලියාපදිංචි කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | ආකිටෙක්චර් ස්ටුඩියෝස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි අංකය | : | පී.වී. 62724 |
| ලියාපදිංචි කාර්යාලය | : | අංක 36, උයන පාර, මොරටුව. |

ප්‍රේමචන්ද්‍ර ඇපා,
සමාගමේ ලේකම්.

03 - 841

## ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත නම සඳහන් පුද්ගලික සමාගම 2008.01.24 දින ලියාපදිංචි කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | බිමෙල්ටා කන්සල්ටන්සි ඇන්ඩ් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි අංකය | : | පී.වී. 62785 |
| ලියාපදිංචි කාර්යාලය | : | අංක 44, වත්තෙගෙදර පාර, මහරගම. |

ප්‍රේමචන්ද්‍ර ඇපා,
සමාගමේ ලේකම්.

03-842

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) පාලාගොල්ල ගැමිදිරිය සමාගම
සමාගමේ අංකය : පී. බී. 3468
සංස්ථාගත කළ දිනය : 2008 මාර්තු මස 07 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : කිරිමඩුතැන්න, පාලාගොල්ල, පස්සර.

සමාගම් ලේකම්.

03-891

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) තැන්නුගේ ගැමිදිරිය සමාගම
සමාගමේ අංකය : පී. බී. 3458
සංස්ථාගත කළ දිනය : 2008 පෙබරවාරි මස 29 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : තැන්නුගේ, පස්සර.

සමාගමේ ලේකම්.

03 - 890

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ, පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සීමාසහිත (ජනතා) සපුරොද ගැමිදිරිය සමාගම
සමාගමේ අංකය : පී. බී. 3469
සංස්ථාගත කළ දිනය : 2008 මාර්තු මස 07 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : සපුරොද, පස්සර.

සමාගමේ ලේකම්.

03 - 889

### පොදු නිවේදනය

සමාගමක් පෞද්ගලික සමාගමක් බවට පත් කිරීම සමග එහි නාමය වෙනස් වීම

1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද, කොළඹ 10, ඩීන්ස් පාර, අංක 400 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි

කාබොටෙල්ස් ලිමිටඩ්

2007, අංක 7 දරන සමාගම් පනතේ (සමාගම් පනත) 29 ඡේදයේ නියමයන්ට අනුකූලව 2008 මාර්තු මස 06 වැනි දින සිට පෞද්ගලික සමාගමක් බවට පත් කරනු ලැබූ හෙයින්, එම සමාගමෙහි නාමය කාබොටෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, යනුවෙන් වෙනස් වූ බැව් සමාගම් පනතේ 11 (2) ඡේදයට අනුව සැළකිය යුතු බව, සමාගම් පනතේ 11 (5) ඡේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ගෲප් සර්විසස් ලිමිටඩ්,
ලේකම්වරු.

2008 මාර්තු මස 14 වැනි දින,
අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10.

03-893

B4 - B 079662

### සමාගමේ නම වෙනස් කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) (8) දරන වගන්තිය යටතේ දැන්වීම

සමාගමේ කලින් නම : එළිෆන්ට් අයිලන්ඩ් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : එන් (පීවීඑස්) 47603
සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 385/5, කෝට්ටේ පාර, රාජගිරිය
සමාගමේ අලුත් නම : ට්‍රාන්ස් වර්ල්ඩ් ඩෙස්ටිනේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

ලේකම්වරුන්.

03-803

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ දැන්වීම

සමාගමේ නම : ටෙරා ඩිසයින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 63157
සංස්ථාගත කළ දිනය : 2008 පෙබරවාරි මස 25 වැනි දින
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 169/ඒ/1, පොල්වත්ත, මිනුවන්ගොඩ.

ලේකම්වරු.

03-804

### ප්‍රොෆෙක් ටෙක්නොලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ් N (PVS) 30698

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාර ඈවරකරු පත් කිරීමේ දැන්වීම

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 144(1) දරන වගන්තිය ප්‍රකාර වූ ලිඛිත යෝජනාවක් 2008 මාර්තු මස 14 වැනි දින සමාගමේ කොටස්කරුවන්ගේ රැස්වීමේ දී මෙහි පහත සඳහන් විශේෂ යෝජනාව සමාගමේ සියළුම කොටස්කරුවන් විසින් අත්සන් කොට සම්මත කර ගත් බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

'සමාගම සිය කැමැත්තෙන් ඈවර කළ යුතු බව හා කොළඹ 04, නන්දන ගාඩ්න්ස් (ඩුප්ලිකේෂන් පාර), අංක 52/1 හි එස්. ගජේන්ද්‍රන් මහත්මිය ඈවරකරු වශයෙන් පත් කළ යුතු බව'.

එස්. ගජේන්ද්‍රන් මහත්මිය,
ඈවරකරු.

අංක 52/1, නන්දන ගාඩ්න්ස්,
(ඩුප්ලිකේෂන් පාර),
කොළඹ 04.

03-854/2

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බව මෙයින් දන්වමි.

සමාගමේ නම : ජෙනරල් ඔටෝමෝටිව් මැනුෆැක්චරිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වි. 63055, 2008.02.14
ලියාපදිංචි ලිපිනය : සේනානායක ගොඩනැගිල්ල, අංක 07, දුම්රියපොල පාර, කොළඹ 03.

කන්සල්ටන්ස් ඇන්ඩ් කෝපරේට් සෙක්‍රට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංකය : 2689618.

03-820

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ කෙරෙන දැන්වීමයි

සමාගමේ නම : සෙවන් ස්ටාර් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 63178
ලියාපදිංචි කාර්යාලය : අංක 164/3 බී, කඩුවෙල පාර, මාලබේ.

සමාගමේ ලේකම්.

03-838

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාර දැනුම් දීමයි

වර්ෂ 2008ක් වූ මාර්තු මස 04 වැනිදා සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : මෙට්‍රික්ස් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 63293
සමාගමේ ලිපිනය : 31 ඒ, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. බී. එස්. සිරිවර්ධන,
(ලේකම්).

03-828

---

### ප්‍රොෆෙක් ටෙක්නොලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ් N (PVS) 30698

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 320 (1) වගන්තිය අනුව කෙරෙන සිය කැමැත්තෙන් ඈවර කිරීමේ යෝජනා දැන්වීම

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 144(1) දරන වගන්තිය ප්‍රකාර වූ ලිඛිත යෝජනාවක් 2008 මාර්තු මස 14 වැනි දින සමාගමේ කොටස්කරුවන්ගේ රැස්වීමේ දී මෙහි පහත සඳහන් විශේෂ යෝජනාව සමාගමේ සියළුම කොටස්කරුවන් විසින් අත්සන් කොට සම්මත කර ගත් බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

'සමාගම සිය කැමැත්තෙන් ඈවර කළ යුතු බව හා කොළඹ 04, නන්දන ගාඩ්න්ස් (ඩුප්ලිකේෂන් පාර), අංක 52/1 හි එස්. ගජේන්ද්‍රන් මහත්මිය ඈවරකරු වශයෙන් පත් කළ යුතු බව'.

ඊ එම් ඇන්ඩ් ඊඑන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරුන්).

එම්ඇන්ඩ්එන් ගොඩනැගිල්ල ( 5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

03-854/1

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2008 මාර්තු මස 4 වන දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : භාරතී ඉන්ෆ්‍රාටෙල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය: පී. වී. 63290
ලියාපදිංචි ලිපිනය : අංක 86, මාලිගාවත්ත, කොළඹ 10.

සමාගම් ලේකම්වරු.

ජේසී ඇන්ඩ් කම්පනි,
අංක 41, ජනාධිපති මාවත,
කොළඹ 01.

03-816

---

### දැන්වීමයි

2008 පෙබරවාරි මස 08 වැනි දින සංස්ථාගත කළ බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : බිස්නස් බසාර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 63190
ලියාපදිංචි කාර්යාලය : අංක 216, ද සේරම් පෙදෙස, කොළඹ 10.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් ලිමිටඩ්,
ලේකම්වරු.

බිස්නස් බසාර් (ප්‍රයිවට්) ලිමිටඩ්.

03-852

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 09 (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : නිව් නවලෝක කන්ස්ට්‍රක්ෂන් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 63121, 2008.02.19
ලියාපදිංචි ලිපිනය : අංක 42, මීගමුව පාර, පැලියගොඩ.

කන්සල්ටන්ස් ඇන්ඩ් කෝපරේට් සෙකට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංකය : 2689618.

03-821

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 8 (1) වගන්තිය යටතේ දැනුම් දෙනු ලබන්නේ අප සමාගමේ නම පහත සඳහන් අයුරු වෙනස් කර ඒ බව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට දැනුම් දුන් බවයි.

සමාගමේ තිබූ නම : ඩාර්ට් එක්ස්ප්‍රස් ලංකා (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : එන් (පීවීඑස්) 649
සමාගමේ ලිපිනය : අංක 260, ශ්‍රී රාමනාදන් මාවත, කොළඹ 15
සමාගමේ නව නම : ඩාර්ට් ග්ලෝබල් ලොජිස්ටික්ස් (පුද්ගලික) සමාගම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03-855

### නිවේදනයයි

රම්බොඩ ෆිලිං ඇන්ඩ් සර්විස් ස්ටේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2007 පෙබරවාරි මස 06 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : රම්බොඩ ෆිලිං ඇන්ඩ් සර්විස් ස්ටේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 62930
ලියාපදිංචි කාර්යාලය : අංක 5, වවේඩන් නිවාස සංකීර්ණය, තවලන්තැන්න නව නගරය, කොත්මලේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මැනේජ්මන්ට් ඇන්ඩ් බිස්නස් ඇඩ්වයිසරි
සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී. වී. 259
සමාගම් ලේකම්වරු.

03-825

---

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ කරනු ලබන විකිණීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩපොල මැදලැස්ස කෝරළේ, දඹදෙණි හත්පත්තුවේ, බෙවිල්ගොමුව කොහොඳපොල දඹේගොඩ සහ ගලතොම්බුව ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද වර්ෂ 1997ක් වූ අප්‍රේල් මස 18 වැනි දිනැති අංක 70/97 දරන පිඹුරේ ලොට් 14 වශයෙන් දැක්වෙන ඉඩම් කැබැල්ල ප්‍රමාණය අ. 0, රූ. 0, පර්. 8.

ප්‍රසිද්ධ නොතාරිස් ඊ. එස්. රැකව විසින් සහතික කරන ලද වර්ෂ 1998ක් වූ දෙසැම්බර් මස 7 වැනි දිනැති අංක 7632 දරන ඔප්පුවෙන් ලැබී ඇති අයිතිවාසිකම් අනුව එෆ් 1128/128 හි ලියාපදිංචි වී ඇති අංක 70/97 දරන එකී පිඹුරේ දැක්වෙන මාර්ගය පාවිච්චි කිරීමේ සහ පවත්වාගෙන යාමේ අයිතිවාසිකම ද සමග වේ.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එස්. ඉහලගම විසින් සහතික කරන ලද්දා වූ වර්ෂ 2004 ක් වූ ජුනි මස 15 වැනි දිනැති අංක 10883 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම පොතුහැර බුලුගල්ල හයිවේ සිට අංක 14 සහ කුරුණෑගල වැහැර තිස්සංක මාවත අංක 7/6 දරන ස්ථානයේ රාජපක්ෂගේ සරත් යන අය පැහැර හැර ඇති හෙයින් නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී විසින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාරව 2008ක් වූ අප්‍රේල් මස 29 වැනි දින පෙ. ව. 11.00 ට ඉහත සඳහන් දේපළ අප විසින් එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2007.08.31 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද 2007.08.15 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න.

*දේපලට පිවිසීම .-* කුරුණෑගල නගර මධ්‍යයේ සිට කොළඹ පාරේ කිලෝමීටර් 11.50 බුලුගල්ල දෙසට ගමන් කළ විට අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවිම් කළ යුතු ආකාරය. -* විකිණීම ස්ථිර කළ වහාම සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලූ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව 90% විකිණීමේ දින සිට දින 30ක් තුළ දී සී/ස නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
04. වෙන්දේසිකරුගේ වෘත්තිය ගාස්තු තීන්දු වූ මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
05. බැංකුව විසින් දරන ලද සියළුම ප්‍රචාරක සහ අනෙකුත් වියදම්,
06. ලිපිකරු හා සෝෂක වේතන රු. 500,
07. නොතාරිස් ගාස්තු විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න : කළමණාකරු - නීති,සීමාසහිත නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, අංක 242, යුනියන් පෙදෙස, කොළඹ 02. .

දුරකථන අංකය : 011-431358.

ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවෝ,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ,
සහ උසාවි කොමසාරිස්වරු, කොළඹ වාණිජ
මහාධිකරණය සහ දිසා
අධිකරණය, බලයලත් වෙන්දේසිකරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182, පළමු මහළ, හල්ස්ඩ්‍රොෆ් පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 011-2388318.

03-862

---

**ලංකා බැංකුව**

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වෙනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම**

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2003.01.31 දිනැති අංක 1274 දරන ගැසට් පත්‍රයේ හා 2003.01.27 දිනැති ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2008.04.30 වෙනි දින පෙ.ව. 11.00ට, මහනුවර, ටොරින්ටන් පාර, අංක 24, ප්‍රධාන කාර්යාලයෙහි, ෂොක්මන් හා සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නවදුන් කෝරළයේ මැදපත්තුවේ, නිවිතිගල ග්‍රාමයේ පිහිටි 'පීන්කන්ද එස්ටේට් ප්ලාන්ටේෂන්' නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. සමරසේකර විසින් සාදන ලද 1982 ජුනි 29 දිනැති අංක 48 දරන පිඹුරේ (LRC අංක ප්‍රසව/12) විස්තර කළ ලොට් 46 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරටඃ ලොට් 45 ද, නැගෙනහිරටඃ එම ඉඩමේ කොටසක් ද, දකුණටඃ ලොට් 47 ද, බස්නාහිරටඃ එස්ටේට් පාර ද, මායිම්ව රූඩ් එකක (අ.0, රූ. 1, පර්.0) බිම් ප්‍රමාණය සමග ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේ වේ. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 175/233 හි ලියාපදිංචි කර ඇත.

තව ද, එකී අංක 48 දරන පිඹුරේ විස්තර කළ එස්ටේට් පාර පාවිච්චි කිරීමේ අයිතිය ද වේ.

කේ. සමරසිංහ,
කළමනාකරු.

ලංකා බැංකුව,
නිවිතිගල.

03-865

---

**පොලිස් නිල සුනඛයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අයත් සේවයෙන් ඉවත් කළ නොයෙක් වර්ගයේ නිලසුනඛයන් 14 දෙනෙක් 2008.03.31 දින පැය 0900 ට මහනුවර අස්ගිරිය පොලිස් නිල සුනඛ මූලස්ථානයේ දී වෙන්දේසි කරනු ලබයි.

මෙම නිල සුනඛයන් 2008.03.29 දින පැය 0900 සිට පැය 1500 දක්වා පරීක්ෂා කර බලා ගැනීමට හැකි බව දන්වා සිටිමි.

මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක,
නිල සුනඛ මූලස්ථානය.

03-861

---

**මහජන බැංකුව**

**ආයතන IIණය නැවත අයකරගැනීමේ අංශය, ප්‍රධාන කාර්යාලය**

1986 අංක 32 දරන පනත විසින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී කොටස යටතේ වෙන්දේසි කිරීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

වරිපනම් අංක 382 (වත්ත)

පිඹුරුපත් අංක 1116 A ලොට් අංක 06 ලෙස සඳහන්, වරිපනම් අංක 382/37 සිට 41 දක්වා) දෙමටගොඩ පාර - දෙමටගොඩ, කොළඹ 09 හි

පිහිටි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි, කොළඹ මහ නගර සභා සීමාවට අයත්, දෙමටගොඩ පාරෙහි පිහිටි බලයලත් මිනින්දෝරු වී. කාර්තිගේසු මහතා විසින් 1951.10.16 දාතමින් යුතු අංක 1116 **A** පිඹුරු පතෙහි ලොට් අංක 6 (04.09.1950) දාතමින් යුතු අංක 1027 පූර්ව පිඹුරුපතෙහි ලොට් අංක **B** ලෙස සඳහන්, දැනට වරිපනම් අංක 382 දරන (වත්ත) පිඹුරුපතෙහි දක්නට ඇති වත්තේ උප කොටස) ලෙස සලකුණු කරන ලද ඉඩම.

පවත්නා ප්‍රමාණය : පර්චස් 39.72.

එහි පිහිටි ගොඩනැගිලි, ගස්වැල්, වතු සියල්ල ඇතුලුව 1116**A** පිඹුරුපතෙහි සඳහන් ලොට් අංක 7 ඉඩමට ඉහලින් පිහිටි මාර්ගයේ අයිතිය ද සමග මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2008 අප්‍රේල් මස 23 වැනි දින (බදාදා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේදී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තීරණය පිළිබඳ දැන්වීම සඳහා 2007.10.12 දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2007.09.27 දින පුවත්පත් (දිනමිණ, ඩේලි නිව්ස්, තිනකරන්) ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුලු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. වෙන්දේසි පිරිවැය සහ වෙනත් අය කිරීම් වෙතොත් ,
6. වෙන්දේසි සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%(සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රධාන කළමණාකරු, ආයතන **II** ණය නැවත අයකරගැනීමේ අංශය, ප්‍රධාන කාර්යාලය, 10 වන මහල, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02 වෙත ගෙවිය යුතු වේ.

දුරකථන අංක : 011-2334265, 011-2481604, 011-2481430,
ෆැක්ස් අංකය : 011-2334265.

යථොක්ත ලිපිනයෙන් අදාළ ඔප්පු සහ අනෙකුත් විස්තර ලබා ගත හැකිය. ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටම ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත **ISO 9001:2000** සහතිකය ලත්,
ශ්‍රී ලංකාවේ පිළිගත්,
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය :081-2227593,
දුරකථන අංක/පැක්ස් අංක:081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය:*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176,
ඊමේල් අංකය :schokman@samera1892.com

03-849

**ඩීඑෆ්සීසී බැංකුව**

(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

**1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ විකිණීම**

***වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම***

*අංක 1074 ඇපකරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර*

බස්නාහිර පළාත, ගම්පහ දිස්ත්‍රික්කයෙහි, අලුත්කුරු කෝරළේ, රාගම්පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාවට අයත්, බණ්ඩිගොඩ, බටගම උතුර හා මා එළිය ගම්මානවල පිහිටි, බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා මහතා විසින් සකසන ලද, 1993 ඔක්තෝබර් මස 12 දාතමින් යුතු පිඹුරුපත් අංක 13486 හි, ලොට් අංක එක්ස් ලෙස සඳහන් 'මා එළිය එස්ටේට්' ලෙස හඳුන්වන ඉඩම, ඉඩමේ ප්‍රමාණය අක්. 04, රූඩ්. 0, පර්. 0.

එහි පිහිටි ගොඩනැගිලි , වතු ඇතුළු සෑම සියලු දේ ද සහ මාර්ග අයිතිය ද සමග කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න මහතා විසින් සහතික කරන ලද, 2000 මාර්තු මස 31 දිනැති, අංක 1074 උකස්කරය ප්‍රකාර, 1982 වසරේ අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ සමාගමක් ලෙස ස්ථාපිත ජා ඇලෙහි එහි ලියාපදිංචි කාර්යාලය පිහිටි (මෙයින් පසු සමාගම ලෙස හඳුන්වන) සෑම් හි ලංකා (පුද්ගලික) සමාගම විසින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2008 අප්‍රේල් මස 22 වැනි දින (අඟහරුවාදා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුලු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 24,650 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකථන අංකය : 011-2442442.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත ISO 9001 : 2000 සහතිකය ලත්, ශ්‍රී ලංකාවේ පිළිගත්,
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය:*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය :081-2227593,
දුරකථන අංකය/ෆැක්ස් අංකය : 081-2224371.
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය:*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176.
ඊමේල් අංකය :schokman@samera1892.com

03-848

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.